සැ. යු. — 2014.06.27 දින පළ වූ අංක 1,869 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,870 - 2014 ජූලි මස 04 වැනි සිකුරාදා - 2014.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 884 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 890 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 892 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූලි මස 25 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූලි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත්‍රයක් සම්පූර්ණ කර "ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න" යන ලිපිනයට 2014 ජූලි මස 18 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 01 | රියදුරු 11 ආ ශ්‍රේණිය | 01 | PL3-2006A<br>රු.12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 2ක් සහිතව විෂය 06ක් සමත්වීම. (එක් වරක දී අවම වශයෙන් විෂය 05ක් සමත් විය යුතු ය.)<br>*වෘත්තීය සුදුසුකම් :-*<br>1. පෞද්ගලික /කුලී රථ හා අඩු ස්ටේෂන් වෑන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම.<br>(බඳවා ගන්නා දින වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.)<br>2. වාහන රියදුරු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br>3. මහා මාර්ග නීති සංග්‍රහ පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br>*වෙනත් සුදුසුකම් :*<br>1. අවම උස අඩි 5 ට වැඩිවිය යුතු ය.<br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ මනා අක්ෂි පෙනීමක් තිබිය යුතු ය. |
| 02. | මුරකරු | 01 | PL1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු.17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් පහ/හය වන ශ්‍රේණිය සමත් විය යුතු ය.<br>*වෙනත් සුදුසුකම් :*<br>1. අවම උස අඩි 5 ට වැඩිවිය යුතු ය.<br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ මනා අක්ෂි පෙනීමක් තිබිය යුතු ය. |
| 03. | ක්ෂේත්‍ර කම්කරු | 03 | PL1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු.17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් පහ/හය වන ශ්‍රේණිය සමත් විය යුතු ය. |
| 04. | සෞඛ්‍ය කම්කරු | 02 | PL1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන සුදුසුකම සලකා බලනු නොලැබේ. |

(2) *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
2. අයදුම්කරු/කාරිය පරම්පරාවෙන් හෝ ලියපදිංචියෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
3. අයදුම්කරු/කාරිය වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 5ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය.

4. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතු ය.
6. රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
7. වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
8. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත ය.
2. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.
3. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ/බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

4. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

1. මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12" x 8" ප්‍රමාණයේ) අයදුම්පත් සකස් කර, ඉල්ලුම්කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2014 ජූලි මස 18 වැනි දිනට පෙර "ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

 (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ..

2. අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු වන අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. :-

 * උප්පැන්න සහතිකය ;
 * අධ්‍යාපන සහතිකය ;
 * තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය;
 * මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;(එකක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගත් එකක් විය යුතුයි.)
 * වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේනම් එම සහතික; (රජයේ/පළාත් පාලන) සේවයේ නියුක්තවූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. අයදුම්කරුවන් අතුරින් නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පුරප්පාඩු පිරවීම සිදු කරනු ලැබේ.

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ සියලු බලතල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

ඊ. ඒ. ශාන්තලතා,
ලේකම්,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 13 වැනි දින,
වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**වලල්ලාවිට ප්‍රාදේශීය සභාව**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (i) මුලකුරු සමග නම :————————.
 (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————.
02. ස්ථිර ලිපිනය:————————.
02.1 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
03. (i) උපන් දිනය :
 (ii) 2014 ............................... දිනට වයස :

අවු.:——————————. මාස:——————————. දින:——————————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

06. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ?:——————————.
පුරවැසිභාවය (පරම්පරාවෙන් ද? නැතහොත් ලියාපදිංචිවීමෙන් ද? යන්න සඳහන් කරන්න)

07. අධ්‍යාපන සුදුසුකම් ඃ (සමත් වූ විභාග පිළිබඳ විස්තර)
(i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————————.
(ii) අ.පො.ස. (සා. පෙළ) විභාගය :——————————.
විභාග අංකය :——————————. විභාග වර්ෂය හා මාසය :——————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |

08. ඔබ දැනට ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තරය :——————————.

09. පළපුරුද්ද වෘත්තීය සුදුසුකම් :——————————.

10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :——————————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසුව දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම ඉල්ලුම්කරු වන...................................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය:——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.
(නිල මුද්‍රාව යොදන්න)

දිනය:——————————.

07-26

---

**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව**

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවල III ශ්‍රේණිය සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | වැඩ පරිපාලක | 01 | PL2-2006A - රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 | * අධ්‍යයන පොදු සහතික පත්‍ර සා/පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය/ශුද්ධ ගණිතය/විද්‍යාව හා සිංහල භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සමත් විය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර).<br>* තනතුරට අදාළව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N. V. Q.2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම ;<br>* පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම - (පුහුණු කාලය අදාළ නොවන අතර සහතිකයක් මගින් පළපුරුද්ද සනාථ කළ යුතු ය.) |
| 02 | විදුලි කාර්මික | 01 | PL2-2006 - A රු. 12,210- 10 x 130 - 10 x 145 - 10 x 160- 12 x 170 - රු.18,600 | * අධ්‍යයන පොදු සහතික පත්‍ර සා/පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය/ශුද්ධ ගණිතය/විද්‍යාව හා සිංහල භාෂාව ඇතුලුව විෂයයන් හයකින් සමත් විය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර.);<br>* තනතුරට අදාළව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N. V. Q.2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම ;<br>* පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම - (පුහුණු කාලය අදාළ නොවන අතර සහතිකයක් මගින් පළපුරුද්ද සනාථ කළ යුතු ය. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (දැනට සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාවක් බල නොපැවැත් වේ.) ;
* අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;
* අයදුම්කරු පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇති අයකු විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය);
* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;
* රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරින්ට ඉල්ලුම්පත් පිළිගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු පහක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නැත්තාවූද, මෙම කාලය තුළ යෙදුන සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයා ගත්තා වූද, සතුටුදායක සේවා කාලයක් තිබෙන්නා වූ ද අය විය යුතු ය ;
* අයදුම්කරුවන් ඒ ඒ තනතුරට අදාළව ඉහත දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
* පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන්නේ ය ;
* මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, රජය හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කිරීමට බඳවා ගනු ලබන සියලු සේවකයින් බැඳී සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

* අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ;

* අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය;

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතික/සුදුසුකම් සනාථ කෙරෙන වෙනත් සහතික,
(iii) බල ප්‍රදේශය තුළ පසුගිය වසර තුනක ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ,
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් පළාතේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් සහතිකයක් විය යුතු ය.)
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබෙ නම් එම සහතික.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.08.04 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, පොල්පිතිගම යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයඳුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලතල පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

එච්. ජී. සත්‍යකාන්ති,
ප්‍රාදේශීය සභා ලේකම්,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ ජූනි මස 11 වැනි දින,
පොල්පිතිගම,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව**

**................................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.

මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.

02. ලිපිනය :——————————.

03. ස්ථිර පදිංචිය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————.

04. උපන් දිනය :

අවුරුද්ද:——————————. මාසය:——————————. දිනය:——————————.

05. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.

07. විවාහක/අවිවාහක බව:——————————.

08. ජාතිය:——————————.

09. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද/පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————.

10. මීට පෙර රජයේ/සංස්ථාවක/මණ්ඩලයක/සේවයේ යෙදුනි නම් ඒ පිළිබඳ විස්තර:——————————.

11. උසාවියක් මගින් ඔබට දඬුවම් පවරා ඇත්ද යන වග:——————————.

12. අධ්‍යාපන සුදුසුකම් :

(සහතිකවල පිටපත් අමුණන්න.)

13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:

* සේවා කාලය සහ විස්තර:——————————.

* එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත):——————————.

14. පළපුරුද්ද සහ වෘත්තීය සුදුසුකම්:

(සහතිකවල පිටපත් අමුණන්න)

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බවත් දනිමි.

_______________,
අයදුම්කරුගේ අත්සන.

දිනය:_____________.

07-06

---

## හක්මණ ප්‍රාදේශීය සභාව

හක්මණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති හක්මණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 03 | 06/2006(iv) (රා.ප.ච.ලේ.) අනුව. පීඑල්1/2006ඒ රු. 11,730 - 10 x 120 - 10 x 130 10 x 145- 12 x 160 - රු.17,600 | අවම වශයෙන් 8 ශ්‍රේණිය/ 9 වසර සමත් විය යුතුය. |

*සේවා කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
03. තෝරාගනු ලබන සේවක සේවිකාවන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි සහ මුදල් රෙගුලාසිවලටද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ හක්මණ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
05. පත්වීම් ලැබීමෙන් පසු අවුරුදු 03ක කාලයකදී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සලකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය .-* මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස් කර 2014. 07.14 වැනි දිනට පෙර ලේකම්, හක්මන ප්‍රාදේශීය සභාව, හක්මණ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍ර ද අසම්පූර්ණ අයදුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ හො'පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුවේ.

උප්පැන්න සහතිකය,
අධ්‍යාපන සහතිකය,
හැඳුනුම්පතේ පිටපතක්,
පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුඅත්සන සහිත ග්‍රාම සේවා සහතිකය.
වසර 3කට වැඩි පළපුරුද්ද සම්බන්ධ සේවා සහතිකය/විදුලි කාර්මිකයෙකු වශයෙන් සේවා සහතිකය,
මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

බඳවා ගැනීමේ ක්‍රමය :-

01. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ වෘත්තීය ප්‍රවීනතාව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දැක්වේ.)
02. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හක්මණ ප්‍රාදේශීය සභාවේ. සභාපති සතුවේ.

සී. ජී. එච්. හල්පගේ,
සභාපති,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2014ජුනි මස 13 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**හක්මණ ප්‍රාදේශීය සභාවේ .................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :—————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :—————————.
03. පෞද්ගලික ලිපිනය :—————————.
04. උපන් දිනය ：

අවුරුද්ද:—————————. මාසය:—————————. දිනය:—————————.

(අ)............................................ දිනට වයස ：

අවුරුදු:—————————. මාස:—————————. දින:—————————.

05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද/එසේ නම් පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන් ද :—————————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:—————————.
07. විවාහක/අවිවාහක බව:—————————.
08. සමත්ව ඇති ඉහළ විභාගය :—————————.
09. ශිල්පීය නිපුණතා :—————————.
10. වෘත්තීය සුදුසුකම් :—————————.
11. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේද ?:—————————.
12. එසේ නම් දඬුවමේ ස්වභාවය :—————————.
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :—————————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————————.

07-24

# පළාත් පාලන නිවේදන

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2014.03.25 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කල ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුල යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 16 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

| *මාර්ග විස්තරය* | *දිග* | *පළල* |
|---|---|---|
| | අඩි 250 | අඩි 06 |

*මාර්ගයේ නම* - ලෙනපිටිය කුඹුර හරහා මාර්ගය
*වසම* - පදවිගම්පල
*ආරම්භය* - ලෙනපිටිය
*අවසානය* - ගස්කදුරුගහමුලවත්ත

පදවිගම්පල ලෙනපිටිය යන ස්ථානයෙන් ආරම්භව වම් පසින් ජේ. බී. දිසානායක යන අයට අයත් ලෙනපිටිය කුඹුර ද,

දකුණු පසින් ජේ. බී. දිසානායක යන අයට ලෙනපිටිය කුඹුරෙන් මායිම් වන්නා වූ ලෙනපිටිය කුඹුර හරහා මාර්ගය

| *මාර්ග විස්තරය* | *දිග* | *පළල* |
|---|---|---|
| | මීටර් 500 | මීටර් 2.4 |

*මාර්ගයේ නම* - මාවතගම ප්‍රධාන පාරේ සිට ඇටඹගස්තැන්න දක්වා මාර්ගය
*වසම* - පරපේ (උතුර)
*ආරම්භය* - රඹුක්කන මාවතගම ප්‍රධාන පාර
*අවසානය* - ඇටඹගස්තැන්න ගල්පිලේවත්ත

රඹුක්කන මාවතගම ප්‍රධාන මාර්ගයෙන් ආරම්භව වම් පසින් එම්. ඩී. ජේ. එස්. රණසිංහ හා අශෝකා ජයන්ත ධර්මදාස යන අයවලුන්ට අයත් ගල්පිලේවත්තෙන් මායිම් වන්නා වූ ද, දකුණු පසින් ඒ. ඩී. සුනිල් පියරත්න යන අයට අයත් ගල්පිලේවත්ත ඉඩමෙන් මායිම් වන්නාවූ ඇටඹගස්තැන්න දක්වා වූ මාර්ගය

07-91/1

---

**රඹුක්කන ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2014.04.29 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසාද යන්න සඳහන් කල ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුල යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 16 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

| *මාර්ග විස්තරය* | *දිග* | *පළල* |
|---|---|---|
| | අඩි 380 | අඩි 12 |

මාර්ගයේ නම - කිරිදිගලවත්තහේන මාර්ගය
වසම - කඩිගමුව
ආරම්භය - රඹුක්කන කඩිගමුව ප්‍රධාන මාර්ගය
අවසානය - කිරිදිගලහේන වත්ත

රඹුක්කන කඩිගමුව ප්‍රධාන මාර්ගයෙන් ආරම්භව වම්පසින් ඒ. එස්. ටී. එම්. සිඩ්නි කඩිගමුව, කේ. ඒ. එම්. පී. බණ්ඩාර හා ඒ. එස්. ටී. ආර්. චමින්ද සංජය කඩිගමුව යන අයවලුන්ට අයත් කිරිදිගලහේන වත්තෙන් මායිම් වන්නා වූ ද,

දකුණු පසින් එස්. වී. ඩී. නිරෝෂා දමයන්ති, ටී. ඩබ්. දූලිකා හේමමාලි, ඒ. එස්. ටී. එම්. ආර්. ලලිත් රෝහන කඩිගමුව, ඒ. ඩබ්. ඒ. චන්ද්‍ර කාන්ති වනිගසූරිය, එස්. ඩී. එම්. එල්. කේ. දිසානායක හා ආර්. වී. නන්දාවතී යන අයවලුන්ට අයත් කිරිදිගලහේනවත්ත ඉඩමෙන් මායිම් වන්නාවූ කිරිදිගලහේන වත්ත මාර්ගය

| *මාර්ග විස්තරය* | *දිග* | *පළල* |
|---|---|---|
| | මීටර් 70 | මීටර් 3.66 |
| | (අඩි 231) | (අඩි 12) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | හුරීමළුව පොදු මාවත |
| වසම | - | හුරීමළුව |
| ආරම්භය | - | හුරීමළුව මාර්ගය |
| අවසානය | - | වසන්තා ප්‍රියදර්ශනීගේ නිවස |

හුරීමළුව මාර්ගයෙන් ආරම්භව වම් පසින් එම්. එම්. අසාද් මයාට, ජී. ඥානවතී, ආර්. එච්. එන්. රණසිංහ, හා ඩබ්. එම්. වසන්තා ප්‍රියදර්ශනී යන අයවලුන්ට අයත් ගස්කදුරුගහමුලහේන, රත්මලේහේන, ඉඹුල්ගහමුලහේන, තල්මුගුනුවේහේන යන ඒකාබද්ධ ඉඩමෙන් මායිම් වන්නා වූද, දකුණු පසින් ආර්. ඒ. නන්දසේන, ටී. ජී. ගුණතිලක, අයි. පී. කේ. පී. පෙරේරා හා ඩබ්. එම්. වසන්තා ප්‍රියදර්ශනී යන අයවලුන්ට අයත් ගස්කදුරුගහමුලහේන, රත්මලේහේන, ඉඹුල්ගහමුලහේන, තල්මුගුනුවේහේන තල්ගස්කුඹුරවත්ත යන ඒකාබද්ධ ඉඩමෙන් මායිම් වන්නාවූ පොදු මාර්ගය

07-91/2

---

# විවිධ දැන්වීම්

## දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

### 2014 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම (සංශෝධිත)

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් 2014.06.03 දින පවත්වනු ලැබූ මහා සභා රැස්වීමේදී තීරණ අංක 08(09ඇ) 01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බවත් ඒ අනුව 2014 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම උපලේඛනයේ 11 වැනි තීරුව අනුව සංශෝධනය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. එම්. ඩී. එච්. ධනසිරි අමරතුංග,
නගරාධිපති.

2014 ජූනි මස 06 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥා පනතේ 247ආ වැනි වගන්තියෙන් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන්නාවූ කිසියම් කර්මාන්තයක් දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2014 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2014 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී කර්මාන්ත බද්ද 2014 වර්ෂයේ ජූලි මස 30 වැනි දිනට පෙර දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරන්නීය.

247 (ආ) ඇතැම් කර්මාන්ත විෂයෙහි බදු අයකිරීම (2)

*උපලේඛනය*

| *1 වැනි තීරුව*<br>*වාර්ෂික වටිනාකම* | *11 වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>රු. |
|---|---|
| රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 250 0 |
| රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන විට | 500 0 |
| රු. 2,500 ඉක්මවන නමුත් 10,000 නොඉක්මවන විට | 750 0 |
| රු. 10,000 ඉක්මවන නමුත් 20,000 නොඉක්මවන විට | 1,250 0 |
| රු. 20,000 ඉක්මවන නමුත් 30,000 නොඉක්මවන විට | 2,000 0 |
| රු. 30,000 ඉක්මවන නමුත් 45,000 නොඉක්මවන විට | 2,750 0 |
| රු. 45,000 ඉක්මවන නමුත් 50,000 නොඉක්මවන විට | 3,500 0 |
| රු. 50,000 ඉක්මවන නමුත් 60,000 නොඉක්මවන විට | 4,250 0 |
| රු. 60,000 ඉක්මවන විට | 5,000 0 |

07-07

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** රු. ශ. | **තැපැල් ගාස්තුව** රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2014.08.01 | සිකුරාදා | 2014.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.08 | සිකුරාදා | 2014.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.15 | සිකුරාදා | 2014.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.22 | සිකුරාදා | 2014.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.29 | සිකුරාදා | 2014.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2014.09.05 | සිකුරාදා | 2014.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.12 | සිකුරාදා | 2014.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.19 | සිකුරාදා | 2014.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.26 | සිකුරාදා | 2014.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ජී. එච්. එල්. වී. ද සිල්වා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.